&× ´ {ÆæÈ à`ÑÍ ó
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

**9 ශ්‍රේණිය** # නර්තනය **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සේරමාන් රජුට වැළඳුණු හිසරුදාව සුව කිරීමට පවත්වන ලද ශාන්තිකර්ම දෙක වන්නේ,
(1) කොහොඹා කංකාරිය, දෙවොල්මඩුව (2) බලි ශාන්තිකර්මය, පහන් මඩුව
(3) දෙවොල් මඩුව, පහන් මඩුව (4) පහන් මඩුව, කඩවර කංකාරිය

02 මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කිරීම අයත්වන්නේ,
(1) සාත්වික අභිනයට (2) වාචික අභිනයට
(3) ආංගික අභිනයට (4) ආහාර්ය අභිනයට

03 උඩරට ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සඳහා යොදාගන්නා ලී වර්ගය වනුයේ,
(1) දෙල්, කිතුල් (2) කොස්, සපු (3) කොස්, තල් (4) කොහොඹ, ඇහැළ

04 කණ්ඩායමකින් තොරව නර්තනය කිරීම කළ නොහැකි නර්තනයකි
(1) ශාස්ත්‍රීය නැටුම් (2) වන්නම්
(3) ගැමි නැටුම් (4) උඩැක්කි නැටුම්

05 සම් උපයෝගී කර නොගන්නා බෙර වර්ගයකි
(1) ගැට බෙරය (2) දඬු බෙරය (3) දවුල (4) බුම්මැඩිය

06 පහන් මඩුවේ අන්තර්ගත නර්තන අංග දෙකකි
(1) දේව කෝල් පාඩුව හා මුදුන් තාලය (2) කෝල් පාඩුව හා යක්කම්
(3) දාන පහ සහ දුම්මල පද (4) පොත්කඩේ පාලිය හා කතා පහ

07 මාත්‍රා 3 තිතට නැටිය හැකි වන්නමකි
(1) හනුමා වන්නම (2) තුරඟා වන්නම
(3) වෛරෝඩි වන්නම (4) ගජගා වන්නම

08 ''තකට දොදොංතා දොංගඩ තරිකිට තකට දොදොංතා'' මෙය
(1) අඩව්වකි (2) සීරුමාරුවකි (3) බෙරපදයකි (4) කස්තිරමකි

09 පහතරට සින්දු වන්නමකට අයත් කොටස් ගණන වන්නේ,
(1) 3 කි. (2) 6 කි. (3) 5 කි. (4) 4 කි.

10 තෙල්මේ ඇඳුම් කට්ටලය භාවිතා වන්නේ කුමන ශාන්තිකර්මයේ දී ද?
(1) බලි ශාන්තිකර්මයේ දී (2) කොහොඹා කංකාරියේ දී
(3) පහන් මඩුවේ දී (4) දෙවොල් මඩුවේ දී

11 තනි තිතේ තාල රූපයකට ඇති වැඩිම මාත්‍රා ගණන වනුයේ,
(1) මාත්‍රා 3 කි. (2) මාත්‍රා 5 කි. (3) මාත්‍රා 4 කි. (4) මාත්‍රා 6 කි.

12 ගැටබෙරයේ මුලින්ම නිකුත්වන හඬ වනුයේ,
(1) ත, තො, නං (2) තත්, ජිත්, තොං, නං
(3) තත්, නං, ජිත්, තොං (4) ජිං, තත්, දොං, තං

13 ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ නැටුම් වැඩි වශයෙන් පැතිරී ඇති ප්‍රදේශ වන්නේ,
(1) වෙරළබඩ ප්‍රදේශය (2) උඩරට ප්‍රදේශය

(3) වන්නි ප්‍රදේශය (4) උතුරු ප්‍රදේශය

14 මලයරජු ගෙන්වීමට භාරගත්තේ කවුද?

(1) ඊශ්වරයා (2) රාහු අසුරේන්ද්‍රයාය

(3) විෂ්ණු දෙවියන්ය (4) පත්තිනි මෑණියන්

15 උඩරට වන්නම් රචනා වූ යුගය ලෙස නම් කරනුයේ,

(1) මහනුවර යුගය (2) කෝට්ටේ යුගය

(3) දඹදෙණි යුගය (4) කුරුණෑගල යුගය

16 ''ඔබින මෙසබ තුළ පැමිණා.....'' මෙම කවි පදය අයත් වන්නම

(1) තුරඟා වන්නම (2) හනුමා වන්නම

(3) වෛරොඩි වන්නම (4) සැවුලා වන්නම

17 පහත බෙර පද අතරින් දෙවොල් බෙරයෙන් වාදනය කළ හැකි බෙර පද වන්නේ,

(1) කුඳ ගත ගත දොම් (2) කුඳ ගත දොං ජිං

(3) කුදි ගත ගදිගත (4) කුං ජිං ගජිගත

18 දෙතිතේ ප්‍රභේද ගණනින්

(1) 2 කි. (2) 3 කි. (3) 3 කි. (4) 4 කි.

19 දණ්ඩි කඳ භාවිතා කරන්නේ,

(1) ගොඩ සරඹ නැටීමේ දී(2) අත් සරඹ නැටීමේ දී

(3) වට්ටම් නැටීමේ දී (4) පා සරඹ නැටීමේ දි

20 දොවොල් මඩුවේ එන නාට්‍යමය අවස්ථාවකි

(1) යක්කම් (2) කපුයක්කාරිය (3) අඹ විදමන (4) ගබඩා කොල්ලය

- පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

21 ගැමි ගායනා ඉතා සංකීර්ණය. ( )

22 ලය ප්‍රධාන කොටස් තුනකි. ( )

23 ජිංගත ගොගො මාත්‍රා 4 තිතට අයත් බෙර පදයකි. ( )

24 රටයකුම උඩරට නැටුමේ එන ශාන්තිකර්මයකි. ( )

25 උඩරට නැටුමේ එන සරඹ සංඛ්‍යාව 12 කි. ( )

26 ගැටබෙරයේ දකුණු ඇස ආරක්ෂා කර ගැනීමට සුරත් තට්ටුව යොදාගනී. ( )

27 තම්මැට්ටම පොකුරු බෙරය නමින් ද හඳුන්වයි. ( ) (ල. 30)

28 සොකරි යනු ගැමි නාට්‍යයකි. ( )

29 දවුල විතතාතත වාද්‍ය භාණ්ඩයකි. ( )

30 ආවැන්දුම යනු කොහොඹා කංකාරියේ එන ගායනය සහිත නර්තන අංගයකි. ( )

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01 සතර අභිනය නම්කර එක් එක් අභිනයන් විස්තර කරන්න. (ල. 10)

02 නර්තනයේ දී සංගීතයෙන් ලැබෙන පිටුවහල පිළිබඳව විස්තරාත්මක විමසුමක යෙදෙන්න. (ල. 10)

03 (1) දෙතිතේ ප්‍රභේදවලට අයත් කස්තිරම් ප්‍රස්තාර කර පෙන්වන්න. (ල. 06)